# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක/ කෘෂිකර්ම උපදේශක / ජනපද නිලධාරි /කාර්මික නිලධාරී (සිවිල්) තනතුරුවල III ශ්‍රේණියට සහ කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණියට (එක් වසරක පුහුණු කාලය) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය

02. සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි III ශ්‍රේණිය

03. සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණිය

04. සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය

05. සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය)

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :- 2021.08.31

03.

3:1 පොදු සුදුසුකම් :-

(අ) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි.

(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

(ඈ) 2021.08.31 දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(ඉ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය.

(ඊ) බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාල සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

(උ) අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනය වනවිට අයදුම්කරනු ලබන ක්ෂේත්‍රයට අදාලව අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අනිවාර්ය වේ.

3:2. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | තනතුර සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම | තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම | | |
| **සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය** | මව්බස (සිංහල /දෙමළ/ඉංග්‍රීසි භාෂාව) ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම | අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ජෛව විද්‍යා විෂය ධාරාව (ජීව විද්‍යාව සමග රසායන විද්‍යාව, භෞතික විද්‍යාව කෘෂි විද්‍යාව, යන විෂයයන්ගෙන් 2 ක්) හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ( ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව) විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයක් ලෙස ගණන් නොගැනේ) | I. සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන සත්ත්ව පාලන පුහුණුව පිළිබඳ විද්‍යාලයකින් ලබා ගන්නා ලද සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය<br>හෝ<br>II. අනුරාධපුර/සිප්පුකුලම සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථාන මගින් නිකුත් කරනු ලබන දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය<br>හෝ<br>III. කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය | 03 |
| **කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණිය** | මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම | අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ජෛවීය විද්‍යා විෂය ධාරාව (ජීව විද්‍යාව සමග රසායන විද්‍යාව, භෞතික විද්‍යාව කෘෂි විද්‍යාව, යන විෂයයන්ගෙන් 2 ක්) හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ( ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව) විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයක් ලෙස ගණන් නොගැනේ) | I. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබා තිබීම<br>හෝ<br>II. කුණ්ඩසාලේ,අඟුණකොළපැලැස්ස පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයකින් නිකුත් කරන කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම<br>හෝ<br>III. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි කාර්මික ආයතනයෙන් නිකුත් කරනු ලබන කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම<br>හෝ<br>IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (කෘෂිකර්ම) ලබා තිබීම<br>හෝ<br>V. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) හයවන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම | 12 |
| **තනතුර** | **අධ්‍යාපන සුදුසුකම්** | | **වෘත්තීය සුදුසුකම්** | |

| | තනතුර සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම | තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **ජනපද නිලධාරි III ශ්‍රේණිය** | මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම | අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාව (ජීව විද්‍යාව සමග රසායන විද්‍යාව, භෞතික විද්‍යාව කෘෂි විද්‍යාව, යන විෂයයන්ගෙන් 2 ක්) හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ( ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව) විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයක් ලෙස ගණන් නොගැනේ) | තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබා තිබීම<br>හෝ<br>II. කුණ්ඩසාලේ,අඟුණකොළපැලැස්ස පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයකින් නිකුත් කරන කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම<br>හෝ<br>III. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි කාර්මික ආයතනයෙන් නිකුත් කරනු ලබන කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම<br>හෝ<br>IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (කෘෂිකර්ම) ලබා තිබීම<br>හෝ<br>V. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) හයවන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම | 03 |

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | තනතුර සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම | තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම | | |
| කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය | මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම | I. අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ගණිතය විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් 03 කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)<br>හෝ<br>II, අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, යන විෂයයන් සහිතව ගණිතය/ ඉංග්‍රීසි/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන්ගෙන් 01 ක් සහිතව විෂයයන් 03 කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) | I.මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>II.ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>III.අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>IV.ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>V.ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම<br>හෝ<br>VI. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) හයවන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම | 71<br>(III ශ්‍රේණිය හා පුහුණු ශ්‍රේණිය) |

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් | |
|---|---|---|---|---|
| | තනතුර සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම | තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම | | |
| **කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු ශ්‍රේණිය**<br><br>**(එක් වසරක පුහුණු කාලය)** | මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම | I. අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ගණිතය විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් 03 කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)<br>හෝ<br>II, අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, යන විෂයයන් සහිතව ගණිතය/ ඉංග්‍රීසි/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන්ගෙන් 01 ක් සහිතව විෂයයන් 03 කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) | I. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක මෙම තනතුරට අදාල ක්ෂේත්‍රගත පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම<br>හෝ<br>II. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාල ක්ෂේත්‍රගත කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම<br>හෝ<br>III. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකමක් ලබා තිබීම | |

සටහන :- I. බඳවා ගැනීමේ පරිපාටියේ 7.1 හි විධිවිධාන හා සටහන අනුව කාර්මික නිලධාරි (සිවිල්) පුරප්පාඩු සංඛ්‍යාවෙන් විවෘත තරඟ විභාගය මගින් 70% ක් පුරප්පාඩු සම්පූර්ණ කරන අතර, 30% ක් සීමිත තරඟ විභාගය මගින් සම්පූර්ණ කරනු ලැබේ.

II. කාර්මික නිලධාරි ( සිවිල්) III ශ්‍රේණියට හා පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේදී පළමුව බඳවා ගනු ලබන්නේ III ශ්‍රේණියට වේ. III ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට ඉතිරි පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් පුහුණු ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

III. ජනපද නිලධාරි හා කෘෂිකර්ම උපදේශක යන තනතුරු 02 සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් සමාන බැවින් එම තනතුරු දෙකටම අයදුම් කරන අයදුම්කරුවන් එක් එක් තනතුරට වෙන වෙනම අයදුම්පත්‍රය බැගින් ඉදිරිපත් කළ යුතුවේ.

04. **මෙම තනතුරුවලට අදාල වැටුප් පරිමාණය :-**

I. අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරුවල III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 3 – 2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 31,040- 10×445- 11×660- 10×730- 10×750 - රු. 57550/- වේ.

II. කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු ශ්‍රේණිය සඳහා දීමනාව

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 (II) අනුව හිමි මාසික දීමනාව - රු.27,140/-

05. III ශ්‍රේණියේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරු යටත් විය යුතුවේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය:-

(I) පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විට ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජන අනුපාතයට අදාළව කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40 % කි.

(II) පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විට, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් හා සහතික පත්‍ර පරීක්ෂා කර, සුදුසුකම් ඇති අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

I. සත්ව සංවර්ධන උපදේශක, කෘෂිකර්ම උපදේශක හා ජනපද නිලධාරි තනතුරු සඳහා වන විභාගයේ විෂය නිර්දේශය:

(01) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි. - ලකුණු 100 යි.
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. මෙම ප්‍රශ්න බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(02) විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය - කාලය පැය 03 යි. - ලකුණු 100 යි.
තනතුරට අදාලව තාක්ෂණික දැනුම මැන බැලෙන බහුවරණ ප්‍රශ්න වලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

II. කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය / පුහුණු ශ්‍රේණිය තනතුරු සඳහා වන විභාගයේ විෂය නිර්දේශය:

(01) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01යි. - ලකුණු 100 යි
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත්, සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිස්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(02) විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය - කාලය පැය 01 යි. - ලකුණු 100 යි
විජ ගණිතය, ජ්‍යාමිතිය ත්‍රිකෝණමිතිය ආදි විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම, ද්‍රව සහ ද්‍රව්‍ය වල භෞතික ගුණ, ද්‍රවස්ථිති විද්‍යාව, මිනුම් ඒකක, පරිමාණ සිතියම් කියවීම, විද්‍යාත්මක ගණනය කිරීම ආදි විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව විභාගය පවත්වන නගරය තීරණය කරනු ලැබේ. විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

**07 අයදුම් කිරීමේ ක්‍රමය**

7:1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඒ-4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද අංක 04 සිට 06 තෙක් දෙවන පිටුවටද වශයෙන් ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත්අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.2 විභාග ගාස්තුව රු. 1000/- කි. මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයේ අදාල කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතරමුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. ඉහත සඳහන් ආයතන වලට හැර වෙනත් කාර්යාලවලට (තැපැල් කාර්යාල, බැංකු) මුදල් ගෙවන ලද කුවිතාන්සි භාරගනු නොලැබේ.

7:3 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.08.31 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට/ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021"** යනුවෙන් සඳහන් කළයුතුය. නියමිත දිනට පසු ලැබෙන ඉල්ලුම්පත්, තනතුරට අදාල සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7:4 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වේතොත් ඒ පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය. එසේම මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව මෙම පුරප්පාඩු හා ඉදිරියේදී ඇති වන පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම මෙම කොමිෂන් සභාව සතුවේ.

පී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
2021.07.26